නැණ පියස

**පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - සබරගමුව - සති පාසල**

විෂය - ව්‍යාපාර හා ගිනුම්කරණ අධ්‍යයනය

සතිය -2021.06.21 සිට 2021.06.25 දක්වා

ශ්‍රේණිය -10

සකස් කරන ලද්දේ දෙහිඕවිට අධ්‍යාපන කලාපය

05 පාඩම -ගිනුම්කරණ සමීකරණය

➢ හිමිකම වෙනස්වන අවස්ථා

ව්‍යාපාරයක හිමිකම වෙනස් වීමට පහත සඳහන් ගනුදෙනු බලපායි .

- අමතර ප්‍රාග්ධනය යෙදීම

ව්‍යාපාරය කරගෙන යන අතරතුරදී ව්‍යාපාරයේ අවශ්‍යතාවය අනුව ව්‍යාපාරයේ අයිතිකරු විසින් යොදවන මුදල් හෝ වෙනත් වත්කම් අමතර ප්‍රාග්ධනය නම් වේ . අමතර ප්‍රාග්ධනය නිසා හිමිකම වැඩි වේ .

- ගැනිලි

ව්‍යාපාරයෙන් අයිතිකරු විසින් තම පෞද්ගලික ප්‍රයෝජනය සඳහා ව්‍යාපාරයෙන් ඉවත් කරගන්නා මුදල් හෝ වෙනත් වත්කම් ගැනිලි නම් වේ. ගැනිලි නිසා හිමිකම අඩුවේ .

- ආදායම් - ආදායම් නිසා හිමිකම වැඩිවේ .
- වියදම් - වියදම් නිසා හිමිකම අඩුවේ .

ව්‍යාපාරයක ආරම්භක ප්‍රාග්ධනයට (හිමිකමට) ඉහත බලපෑම් සිදු කළ පසු අවසාන ප්‍රාග්ධනය (හිමිකම) පහත පරිදි ගණනය කළ හැක.

| | |
|---|---|
| ආරම්භක ප්‍රාග්ධනය | ×××× |
| + අමතර ප්‍රාග්ධනය | ××× |
| ආදායම් | ××× |
| | ××××× |
| (-)වියදම් | (×××) |
| ගැනිලි | (×××) |
| 2020.12.31 දිනට ප්‍රාග්ධනය | ××××× |

**නිදසුන :** කාවින්දගේ ව්‍යාපාරයෙහි 2020.01.01 දිනට පැවති ප්‍රාග්ධනය රු .150 000 කි. 2020.08.05 දින ඔහු ලොතරැයි දිනුමකින් ලද රු. 25 000 ක් තම ව්‍යාපාරය සඳහා යෙදවීය . 2020 වර්ෂය සඳහා රු. 58 000ක ආදායමක් ලද අතර වර්ෂයේ වියදම රු 32 000ක් විය. 2020.12.31 දිනට කාවින්දගේ ව්‍යාපාරයේ හිමිකම ගණනය කරන්න.

රු

| | |
|---|---|
| 2020.01.01 ප්‍රාග්ධනය | 150 000 |
| + අමතර ප්‍රාග්ධනය | 25 000 |
| වර්ෂයේ ආදායම | 58 000 |
| | 233 000 |
| වර්ෂයේ වියදම | (32 000) |
| 2020.12.31 දිනට ප්‍රාග්ධනය | 201 000 |

ඔබගේ පෙළ පොතේ පිටු අංක 65 අධ්‍යනය කර පහත සඳහන් අභ්‍යාස විසඳන්න .

2020 වර්ෂය සඳහා ධම්මිකගේ ව්‍යාපාරයේ මුළු වාර්ෂික වියදම රු. 72 000 ක් වූ අතර වර්ෂයේ ආදායම රු. 120 000 ක් විය. වර්ෂය තුළ අයිතිකරු රු. 30 000ක මුදල් ගැනිලි සිදුකර ඇති අතර රු 50 000 ක අමතර ප්‍රාග්ධනයක් යොදවා ඇත . 2020.01.01 දින පැවති ප්‍රාග්ධනය රු. 100 000ක් වූ අතර 2020.12.31 දිනට ධම්මිකගේ ව්‍යාපාරයේ හිමිකම ගණනය කරන්න .

- ඔබගේ පෙළ පොතේ පිටු අංක 67 හි සඳහන් ක්‍රියාකාරකම් 03 සඳහා පිළිතුරු සපයන්න .